GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

25/07/2014

**මාධ්‍ය නිවේදනයයි.**

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ තීරණ වලට එරෙහි වෙමින් කටයුතු කරන වෛද්‍ය ලලන්ත රණසිංහ සහ වෛද්‍ය නිහාල් රත්නසේන එම කටයුතු වලින් වහාම ඉවත් කළ යුතු බව මධ්‍යම කාරක සභාව ඒකමතිකව තීරණය කර ඇත. අප සංගමයේ ව්‍යවස්ථාවට අනුව සංගමයේ භාරකරුවන්ට අත්තනෝමතික ලෙස කටයුතු කල නොහැක. නමුත් මෙම වෛද්‍යවරු දෙදෙනා සංගමයේ නිලවරණ කමිටුවට සහ කෘත්‍යාධිකාරී මණ්ඩලය නීතිය ඉදිරියේ අපහසුතාවයට පත් වන ආකාරයෙන් සිදු කරන කටයුතු වහාම අත් හිටුවන ලෙස මධ්‍යම කාරක සභාව ඔවුන්ට දැනුම් දී ඇත.

මධ්‍යම කාරක සභාවේ සියලුම සාමජිකයන්ගේ අත්සනින් මෙම දැනුම්දීම් කර ඇත. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ නිලවරණයක් ජය ගත නොහැකි වෛද්‍යවරු අතලොස්සක් සංගමය අකර්මන්‍යව තබා ගැනීමට දැනට කරගෙන යන වැඩ පිලිවෙලට උපකාරයක් වන අයුරින් ඉහත වෛද්‍යවරු දෙදෙනා කටයුතු කර ඇත. 2014 ජුනි 28 වන දින පැවති මහ සභාවේදි එම වෛද්‍යවරුන් දෙදෙනාට විරුද්ධව විශ්වාස භංගයක් ඒකමතිකව සම්මත වී ඇත.

සංගමයේ සාමාජිකයන්ගේ ඒකමතිකව සම්මත වූ විශ්වාස භංගයක් ඇති අයවලුන් සංගමය වෙනුවෙන් පෙනී සිටීම නුසුදුසු බව, සෙසු භාරකරුවන් තිදෙනාද අධිකරණයට නීතිඥයන් මාර්ගයෙන් දැනුම් දී ඇත.

ස්තුතියි,

වෛද්‍ය චන්දික එපිටකඩුව
මාධ්‍ය අනු කමිටුව,

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර | වෛද්‍ය චන්දික එපිටකඩුව | 0718609961 |
| | වෛද්‍ය ප්‍රසාද් රණවීර | 0773527476 |
| | වෛද්‍ය විපුල ඉන්ද්‍රලාල් | 0717368142 |
| | වෛද්‍ය හරිත අලුත්ගේ | 0718121619 |
| | වෛද්‍ය අමිල මදුරාගොඩ | 0773553186 |